**අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

**-----------------------------------------------------------**

අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව 2021 සැප්තැම්බර් 08 දින එළැඹි ව්‍යාපෘති ඇගයීමේ ලේඛණයෙහි 55 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක වල ව්‍යාපෘති ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ආරක්ෂිත කාර්යක්ෂම සහ දේශගුණයට ඔරොත්තු දෙන සම්බන්ධතාවයන් සැපයීම සහ කෘෂිකාර්මික සැපයුම් දාම ශක්තිමත් කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 101,499.6 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් මූල්‍යනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. 2023 අප්‍රේල් 19 දිනැති අංක RES 51645 ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවට අනුව, අවිනිශ්චිත සහ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සඳහා එ.ජ.ඩො. මිලියන 325 ක් නැවත වෙන්කිරීම හේතුවෙන් ණය මුදල රු. මිලියන 54,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 150 ක් දක්වා අඩු කරන ලදී. රු. මිලියන 300 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.83 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2026 ඔක්තෝම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. (මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමේ 2.03 වගන්තියට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැදීම් ගාස්තු (Commitment Charges) සහ පොලී ගිණුම්ගත කර නොතිබුණි. | 6,392 | ණය හා බැදුනු බැදීම් ගාස්තු සහ පොලී ණය ගිවිසුමේ සංරචකයක් ලෙස දරනු නොලැබේ. | බැදීම් සහ පොලී ගාස්තු ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අතුරු ගෙවීම් සහතිකවල ඇතුළත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 33.43 | අයකරගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත් පැකේජ හතරක හිඟහිටි අතුරු ගෙවීම් සහතික වටිනාකම ගිණුම්ගත කර තිබුණි. | හිඟහිටි වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ හිඟ අතුරු ගෙවීම් සහතිකවලින් අඩු කරන ලද රැඳවුම් මුදල් මූල්‍ය ප්‍රකාශවල වෙනම හඳුනාගත යුතු වුවද, මාතලේ සහ මොණරාගල දිස්ත්‍රික්කවල පිළිවෙලින් 251198 පැකේජයේ කැබලි අංක 2 සහ 251205 පැකේජයේ කැබලි අංක 3 ට අදාළ රැඳවුම් මුදල් වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු රඳවුම් මුදල් ලෙස ඇතුළත් කර නොතිබුණි. | 4.3 | ඉදිරියේදී අතුරු ගෙවීම් සහතිකය සඳහා ප්‍රතිපාදන සැලසීමේදී එය නිවැරදි කරනු ඇත. | ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල රඳවුම් මුදල් පෙන්විය යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත් කොන්දේසි 14.3 (iii) වගන්තියට අනුව, කොන්ත්‍රාත් අගයෙන් සියයට 5 ක සීමාව දක්වා සිදුකරන ලද වැඩවලින් සියයට 10 ක් රඳවා තබා ගත හැකිය. සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවුම් මුදල් වැඩිපුර අයකර ඇති බව නිරීක්ෂණය විය. | 4 | කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක උපරිම සීමාව ඉක්මවා යම් කොන්ත්‍රාත් පැකේජයක රඳවා තබා ගැනීම් වැරදි ලෙස අඩු කර ඇත. කෙසේ වෙතත්, මෙම වැඩිපුර අඩු කරන ලද රඳවා ගැනීමේ මුදල මීළඟ අතුරු ගෙවීම් සහතිකයෙන් ගැලපීම් කරනු ඇත. | කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රියාවලිය කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුකූල විය යුතු අතර දෙපාර්ශවයේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 8.4 සහ 8.7 වගන්ති | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි වල දක්වා ඇති පිළිගත හැකි හේතු මත කොන්ත්‍රාත්කරුට වැඩ නිම කිරීම සඳහා කාලය දීර්ඝ කරවා ගැනීමට (EOT) හිමිකම් ඇත. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාලය දීර්ඝ කරවා ගැනීම් නොමැතිව කොන්ත්‍රාත්තු 07 ක් අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණු අතර කොන්ත්‍රාත් පොදු | රට තුල පැවති ආර්ථික අර්බුදය රත්නපුර, මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල කොන්ත්‍රාත් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ අතර ඒමත වූ ඉන්ධන හිඟය, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟකම සහ ප්‍රවාහන ගැටළු හේතුවෙන් ශ්‍රමිකයන්ගේ හිඟයක්ද ඇතිවිය. මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, | කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රියාවලිය කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත් අනුමත කාල සීමාව අවසන් වීමට පෙර කාල දිගුවක් ලබාදීමට හෝ ප්‍රමාද වූ කාලය සඳහා දඩ මුදල් අය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් කොන්දේසිවල දක්වා ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව කාලය දීර්ඝ කිරීම් (EOT) වරින් වර ඉල්ලා තිබුණි. | |
| (ආ) | ණය ගිවිසුමේ උපලේඛන 2 හි I.B 2 වගන්තිය | ණය ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට මාස තුනකක් ඇතුලත ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතක් (POM) පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙහයුම් කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් එවැනි අත්පොතක් භාවිතා කිරීම සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට අනාවරණය නොවුණි. තවද, මේ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ අපගේ විගණන වාර්තා මගින් ද පෙන්වා දී තිබුණු අතර මෙම තත්ත්වය ව්‍යාපෘති කාලසීමාව තුළ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට සෘජුවම බලපෑ හැකි බව විගණන මතය විය. | ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත (POM) සංශෝධනය විය යුතුය. එබැවින්, ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි ගැලපීම් සිදු කරන ලෙස 2023 ඔක්තෝම්බර් මස සිදුකළ ලෝක බැංකු අවසන් සමාලෝචනයේදී නිර්දේශ කර තිබුණි. | ණය ගිවිසුම් කොන්දේසිවලට අනුගත විය යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වනු ලබන්නේ ගැටළුවල ප්‍රමුඛතාවය සහ එහි අවශ්‍යතා සලකා බැලීමෙනි. මූලික වශයෙන්, ව්‍යාපෘතිය එහි ක්‍රියාත්මක කිරීමේ අදියරේ පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සුමටව ක්‍රියාත්මක විය. | සියලුම මෙහෙයුම් කමිටු නියමිත ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 2012 පෙබරවාරි දිනැති යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (වැඩ) සඳහා ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය | ඉංජිනේරුවන්, ව්‍යාපෘති අධ්‍යක්ෂ, කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයින් සහ ඉංජිනේරුවරයාගේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මාසිකව ප්‍රගති රැස්වීම් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, දිස්ත්‍රික්ක | මාර්ග හඳුනාගැනීමේ කටයුතු, අනෙකුත් යෝජිත දිස්ත්‍රික්ක ආශ්‍රිත ප්‍රසම්පාදන ආශ්‍රිත කටයුතු සමගාමීව සිදුකිරීමට ව්‍යාපෘති අධීක්ෂණ කාර්ය මණ්ඩලය සහභාගි විය යුතු බැවින්, ඇතැම් දිස්ත්‍රික්ක සඳහා | විශේෂිත මාර්ගෝපදේශවලට අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා වූ මාර්ගෝපදේශයේ 2 වන වගන්තියේ CA 38 සිට 41 දක්වා ක්‍රියා පටිපාටි | කිහිපයක අපේක්ෂිත රැස්වීම් සංඛ්‍යාව පවත්වා නොමැති බව නිරීක්ෂණය විය. | මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

(අ) මාර්ග පුනරුත්ථාපනය

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2023 දෙසැම්බර් 31 දිනට** | | **විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේකෂිත භෞතික කාර්යසාධනය කි.මී.** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය කි.මී.** | | |
| ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | 1,096.8 | 251.18 | ව්‍යාපෘතිය ආරම්භ කර වසර 02 කට පසුව එනම් 2023 දෙසැම්බර් 31 දින වන විට සිවිල් කටයුතුවල සමස්ත භෞතික ප්‍රගතිය නියෝජනය කළේ සියයට 27.04 ක් පමණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | සිවිල් වැඩ ප්‍රගතිය ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල සියලු ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පිළිබිඹු කරයි. මෙය සම්පූර්ණ දිගෙන් තාර දැමූ මාර්ග දිග කොටසට පමණක් සීමා නොවේ. |
| **විගණකගේ නිර්දේශය** | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

(ආ) මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2023 දෙසැම්බර් 31 දිනට** | | **විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේකෂිත භෞතික කාර්යසාධනය කැබලි** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය කැබලි** | | |
| ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | 27 | 24 | 2023 දෙසැම්බර් 31 දිනට කැබලි 02 ක පමණක් පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි කොටස් 22 හි භෞතික ප්‍රගතිය සියයට 15.45 සිට | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සහ දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය |

සියයට 99.3 දක්වා පවතින බව නිරීක්ෂණය විය. තවද, රත්නපුර, මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල වැඩ අවසන් කර නොමැති කැබලි අක්ෂර 08 ක මුල් කොන්ත්‍රාත් කාලය 2023 දෙසැම්බර් 31 දිනට අවසන් වී ඇති බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | 2023 දෙසැම්බර් අවසන් වන විට දිස්ත්‍රික්ක 7 ක කොන්ත්‍රාත් 24 ක් ප්‍රදානය කර තිබුණි. සිවිල් වැඩ කොන්ත්‍රාත් විවිධ කාල පරාසයන් යටතේ ප්‍රදානය කරනු ලබන බැවින්, එක් එක් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය අදාළ කොන්ත්‍රාත්තුවේ වැඩසටහන මත රඳා පවතී. එක් කොන්ත්‍රාත්තුවක ප්‍රගතිය අනෙක් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සමඟ සැසඳිය නොහැක. කෙසේ වෙතත්, පවතින ආර්ථික අර්බුදයත් සමඟ කොන්ත්‍රාත් දෙකක් නියමිත වේලාවට අවසන් කරන ලදී. |
| **විගණකගේ නිර්දේශය** | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

**සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කි.මී. 76.62 ක් ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම කොටස් හතරක් යටතේ ප්‍රසම්පාදනය කර ඇති අතර පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව කැබලි අංක 3 සහ 4 නැවත ලංසු කැඳවීමට නිර්දේශ කර තිබුණද, රු. මිලියන 1,150 ක් සහ රු. මිලියන 824 ක් වශයෙන් ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කරමින් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණු අතර තවද, සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තු සහ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. | ලෝක බැංකුවේ නිර්දේශ අනුව නැවත ටෙන්ඩර් කැඳවීමේ තීරණය අවලංගු කරන ලදී. පසුව, ඔවුන්ගේ මගපෙන්වීම අනුව ඉංජිනේරු ඇස්තමේන්තු නැවත සමාලෝචනය කරන ලදී. ලංසු ඇගයීම් වාර්තාව (BER) සමග සමගාමීව සංශෝධිත ඇස්තමේන්තු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර විෂමතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 7.9.2 (ග) ඡේදයට පටහැනිව ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කිරීමෙන් පසුව වුවද කැබලි අක්ෂර 03 සහ කැබලි අක්ෂර 04 හි පිළිගත් | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ජාතික මට්ටමින් ප්‍රසිද්ධ කර සිදු කරන ලදී. කැබලි අංක-3 සහ කැබලි අංක-4 හි මූලික | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර විෂමතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය |

| | | | |
|---|---|---|---|
| | අවම ලංසු අගයන් පිළිවෙලින් සියයට 23.65 සහ සියයට 26.31 ට වඩා වැඩි විය. | ඉංජිනේරු ඇස්තමේන්තුවල පැවති අපගමණයන් හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) නිර්දේශය සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) මූලික තීරණය ප්‍රකාරව නැවත ලංසු කැඳවීමට තීරණය කරන ලදී. | යුතුය. |
| (ඇ) | ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනයෙන් පසුව පවා අවම ලංසු මිලෙහි විචලනය සියයට 23 ක වැඩිවීමක් පෙන්නුම් කළද, ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණ (IPF) ණය ගැණුම්කරුවන් සඳහා වන ලෝක බැංකු රෙගුලාසි 5.58 (ඇ) වගන්තියට පටහැනිව අදාළ කොන්ත්‍රාත්කරුවන් සමඟ එකඟතාවයකට පැමිණීම හෝ නැවත ලංසු කඳවීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. | ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණ (IPF) ණය ගැණුම්කරුවන් සඳහා වන ලෝක බැංකු රෙගුලාසි ලංසු ඇගයීම සහ ලංසු ලේඛනය සඳහා නොව, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය සඳහා මාර්ගෝපදේශයක් ලෙස යොදාගනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර විෂමතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

3.3 **ඌන උපයෝජිත සම්පත්**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සක්‍රීය කිරීම සහ මෑත කාලීන ආර්ථික අර්බුදය, ණය අර්බුදය සහ විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතා හිඟයට ප්‍රතිචාර වශයෙන් අරමුදල් වෙන් කිරීම අනුව හදිසි ප්‍රතිචාර සංරචකය වෙත එ.ජ.ඩො. මිලියන 325 ක් වෙන් කිරීමෙන් පසු එ.ජ.ඩො. මිලියන 500 ක මූලික ණය මුදල එ.ජ.ඩො. මිලියන 175 දක්වා අඩුවී තිබුණි. ව්‍යාපෘතියේ රු. මිලියන 59,062.51 ට සමාන එ.ජ.ඩො. මිලියන 175 ක මුළු ප්‍රතිපාදනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය රු. මිලියන 13,951.87 ක් පමණක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. දැනට පවතින කොන්ත්‍රාත්තුවල මන්දගාමී ප්‍රගතිය සහ ව්‍යාපෘතියේ 2 වන සංරචකය ආරම්භ කිරීම ප්‍රමාදවීම ණය අරමුදල් භාවිතය දුර්වල වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | රට තුළ පැවති ආර්ථික සාධකවල අයහපත් හැසිරීම් සහ ආර්ථික පසුබෑම හේතුවෙන් ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | ණය අරමුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | රු. මිලියන 11,674.16 ක ණය ප්‍රතිපාදන වලින් ව්‍යාපෘතිය භාවිතා කර තිබුණේ රු. මිලියන 9,045.64 ක් පමණක් වූ අතර එය සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 77.48 ක් නියෝජනය විය. | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රට තුළ පැවති ආර්ථික සාධකවල අහිතකර හැසිරීම් සමඟ ව්‍යාපෘති කාර්ය සාධනය ප්‍රමාද වීම සහ ආර්ථික පසුබෑම, අයහපත් කාලගුණික තත්ත්වය සහ 2023 | ණය අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂය තුළ සමහර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයයි. | |
| (ඇ) | ව්‍යාපෘතියේ විශේෂ ඩොලර් ගිණුම අංක. 73633 (SL-2019) කට අනුව, මෙම ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් වශයෙන් රු. මිලියන 8,638.70 ට සමාන එ.ජ.ඩො. මිලියන 26.5 ක මුදලක් ලබා දී ඇති අතර එ.ජ.ඩො. මිලියන 6.72 කට සමාන රු. මිලියන 2,174.55 ක මුදලක් වසර අවසානයේදී භාවිතා නොකර ඉතිරිව තිබුණි. ණය නියෝජිතායතනයට අනාර්ථික ලෙස ගෙවීමට සිදුවන බැඳීම් ගාස්තු කපාහැරීම සඳහා නිසි ඇගයීමකින් පසු අත්තිකාරම් ඉල්ලා සිටිය යුතු බව විගණනය නිරීක්ෂණය කරයි. | රට තුළ පැවති ආර්ථික සාධකවල අහිතකර හැසිරීම් සහ ආර්ථික පසුබෑම, අයහපත් කාලගුණික තත්ත්වය සහ 2023 වසර තුළ සමහර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නොවැළැක්විය හැකි ප්‍රමාදය සමඟ ව්‍යාපෘති කාර්ය සාධනය ප්‍රමාද වීම හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. | ණය අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම - (උප සංරචක 1.2)**<br>ව්‍යාපෘති ඇගයීම් ලේඛනයට අනුව, උප සංරචක 1.2 යටතේ මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. මෙම උප සංරචකය මගින් මාර්ග අංශයේ සමස්ත කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ විකාශනය වන සම්බන්ධතා අවශ්‍යතා සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර 02 ක් ගතවී ඇතත් පළාත් සහ ග්‍රාමීය මාර්ග පද්ධතිය ඉලක්ක කර ගනිමින් මාර්ග වැඩිදියුණු කිරීමේ තාර්කික වැඩසටහනක් සංවර්ධනය කිරීම, ව්‍යුහය විධිමත් කිරීම සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීමට පිහිටුවා ඇති ආයතනික සැකසුම සමාලෝචනය කිරීම සහ මාර්ග අංශය කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු රාජ්‍යය ආයතනවල නියෝග ලබාදීම, ඔරොත්තු දෙන මාර්ග ඉදිකිරීමට මූල්‍යකරණය වැඩි දියුණු කිරීම සඳහා විවිධ යාන්ත්‍රණ ගවේෂණය කිරීම වැනි අපේක්ෂිත කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අ.ස.සං. ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවය කරන ව්‍යාපෘති ඉංජිනේරුවන් සංඛ්‍යාව සීමිත වීම සහ ඉහත සඳහන් සංරචක යටතේ යෝජනා කර ඇති ක්‍රියාකාරකම් අ.ස.සං. ව්‍යාපෘතියට පමණක් සීමා නොවීම හේතුවෙන්, මාර්ග අංශයේ සමස්ථ කළමනාකරණය වැඩිදියුණු කිරීම වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මා.සං.අ. යේ අදාළ අංශවල සහාය ලබාගනු ඇත. | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

(ආ) **මාර්ග අංශයේ සහ ප්‍රජා ධාරිතාව වැඩි දියුණු කිරීම - උප සංරචක 1.3**

| | | |
|---|---|---|
| 2023 මැයි 09 දිනැති ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 24 වගන්තිය සහ අංක. RES 51645 දරන ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවට අනුව, මෙම උප සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 8.75 න් එ.ජ.ඩො. මිලියන 7.25 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සංරචකය යටතේ අපේක්ෂිත කාර්යයන් වන රාජ්‍ය අංශයේ ආයතන සඳහා ධාරිතා ගොඩනැගීම, දේශගුණයට ඔරොත්තු දෙන මාර්ග ජාල සැලසුම් කිරීම, නඩත්තු කිරීම සහ දැනුම සංවර්ධනය කිරීම, දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවා සපයන්නන් සඳහා ධාරිතා ගොඩනැගීම සහ ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් සඳහා ධාරිතාව ගොඩනැගීම සහ පුහුණුව සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.14 ක මුදලක් පමණක් වැය කරතිබුණි. එබැවින් ව්‍යාපෘති කාලසීමාව තුළ එක් එක් උප සංරචකයේ ඉලක්ක සපුරා ගැනීම විගණනයේදී සැක සහිත වනු ඇත. | සංරචක 1.3 යටතේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය දැනටමත් මූලිකත්වය ගෙන තිබුණි. තවද, ඉහත සඳහන් සංරචකය යටතේ කාර්යයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සෑම පියවරක්ම ගනු ඇත. | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

(ඇ) **සංරචක - 2 ක්‍රියාත්මක කිරීම : ගොවීන් සඳහා සැපයුම් දාමය සහ සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම**

| | | |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ස්ථාපිත කිරීමට නිර්දේශ කර තිබුණි. මූලිකව, මෙම සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 50 ක මුදලක් වෙන් කර තිබුණු අතර එය 2023 මැයි 09 දින ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවෙන් එ.ජ.ඩො. මිලියන 15 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නිර්දේශවලට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම සංරචකය ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, සංරචක 2 සම්බන්ධ කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA) යටතේ පවතින අතර යෝජනාව අවසන් කිරීමට ප්‍රමාද වී තිබුණි. එබැවින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත අනුමත යෝජනාව ලැබුණු පසු, සංරචක 2 ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | **ව්‍යාපෘතිය යටතේ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සක්‍රීය කිරීම**<br><br>භාණ්ඩාගාර ලේකම්ගේ 2022 මැයි 09 දිනැති ලිපිය සහ ලෝක බැංකුවේ නේවාසික අධ්‍යක්ෂක විසින් 2022 අගෝස්තු 18 දින එවන ලද ලිපියට අනුව, ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 325 ක මුදලක් වෙන් කර තිබුණි. ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම සඳහා, ක්ෂණික අවශ්‍යතා සහ අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සමාජ ආරක්ෂණය ලබා දීමෙන් සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමට හදිසි ප්‍රතිචාර සංරචකයට අරමුදල් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (අ) | ව්‍යාපෘතිය ආරම්භයේ අනුමත කරන ලද විෂය පථයේ වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වෙනම ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවක් යොමු කර ඇත. | මූලික අරමුණු වෙනස් කිරීම සඳහා අනුමැතිය ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ විෂය පථය සීමා කිරීමෙන් පසු, ව්‍යාපෘති සංවර්ධන අරමුණු, ව්‍යාපෘති ප්‍රතිඵල රාමුව, ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන, වියපැහැදම් ඉලක්ක සහ කොන්දේසි, පරිසරික සහ සමාජ රාමුව ඒ අනුව වෙනස් විය යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ඇගයුම් ලේඛනය ඒ අනුව සංශෝධනය කර නොතිබුණි. එය අනාගතයේ අපේක්ෂිත ප්‍රගතියට අහිතකර ලෙස බලපෑ හැකිය. | ණය නියෝජිතායතනයේ සහයෝගයෙන් ව්‍යාපෘති ඇගයුම් ලේඛනය සංශෝධනය කරණු ලැබේ. සියලුම සංශෝධන සහිතව 2023 අප්‍රේල් 6 වැනි දින භාණ්ඩාගාර ලේකම් වෙත නේවාසික අධ්‍යක්ෂ විසින් යවන ලද ලිපියේ ණය ගිවිසුම් මෙන්ම ව්‍යාපෘති ඇගයුම් ලේඛණයට අදාළ සංශෝධනයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර තිබුණි. | සංශෝධනයට අනුව ව්‍යාපෘති ඇගයුම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 මැයි 09 දින ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාව අනුමත කිරීමෙන් පසුව, හදිසි අවශ්‍යතා ප්‍රතිචාර පැකේජය සඳහා එ.ජ.ඩො. මිලියන 325 ක මුදලක් හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සක්‍රීය කිරීම හරහා නැවත වෙන් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ මුළු පිරිවැය අඩු විය. කෙසේ වෙතත්, 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 3.2 ඡේදයට පටහැනිව ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර අයත් සීමාවන් සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවා තිබුණි. | ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාව අනුමත කිරීමෙන් පසුව, ඒ අනුව සංශෝධිත වැටුප් පිළිබිඹු වන පරිදි ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩල කොන්ත්‍රාත්තු සංශෝධනය කිරීම සිදු කරන ලදී. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගත වියයුතුය. |